# ප්‍රසම්පාදන සැලැස්ම

# 2022

**පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු**

**කොමසාරිස් කාර්යාලය**

**දැක්ම**

රාජ්‍ය සහ වෙනත් ඒ හා සමාන ආයතනවල නිලධාරීන්ගෙන් සිදුවන පරිපාලනමය අසාධාරණකම් පිටු දැකීමේ අරමුණින් යුක්තව, සුපරීක්ෂාකාරී පිළිවෙතක් අනුගමනය කරමින්, විශේෂයෙන්ම අපක්ෂපාතී හා විනිවිද භාවයෙන් යුක්ත සාධාරණ හා යුක්තිසහගත විනිශ්චයන් ලබාදීම තුලින්, වඩා යහපත් ජනතා මෙහෙවරක් ඉටුකරදීම සහතික කිරීම සඳහා සියලු ප්‍රයත්නයන් දැරීම අපගේ දැක්ම වේ.

**මෙහෙවර**

රාජ්‍ය සහ පළාත් පාලන, ව්‍යවස්ථාපිත මණ්ඩල, සංස්ථා සහ අර්ධ රාජ්‍ය ආයතනවල නිලධාරීන් විසින් සිදු කරනු ලබන මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් සිදු කරනු ලබන පැමිණිලි පිළිබඳව අපක්ෂපාතීව පරීක්ෂා කර, ඉන් අනතුරුව එවැනි උල්ලංඝනය කිරීම් නිවැරදි කිරීම සඳහා වන ප්‍රතිකර්ම ඉදිරිපත් කරමින් ඒ සඳහා සුදුසු නියෝග, තීරණ, යෝජනා සහ නිර්දේශ ඉදිරිපත් කිරීම. ඉහත සඳහන් ආකාරයේ අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් තුලට, පරිපාලනමය අවගමනයන් සහ විවිධාකාර අනෙකුත් අසාධාරණකම් සහ ශ්‍රී ලංකා ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් පිළිගෙන ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් ද ඇතුලත් වේ.

**ප්‍රධාන කාර්යයන්**

රාජ්‍ය දෙපරේතමේන්තු, සංස්ථා, පළාත් සභා හෝ වෙනත් එවැනි ආයතනයක නිලධාරීන් විසින් සිදු කරනු ලැබූ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් හෝ ඒ හා සමාන අසාධාරණකම් පිටුදැකීම අරමුණු කරගෙන, පොදු මහජනතාව විසින් සෘජුවම ඔම්බුඩ්ස්මන්වරයා වෙත ඉදිරිපත් කරනු ලබන පැමිණිලිවලට අදාලව විමර්ශනයන් සිදුකර ඉන් අනතුරුව, දෝෂ සහිත පරිපාලනමය තීරණයන් ඇතොත්, ඒවා ආපසු හරවමින් වෙනස් කරලීම සඳහා ඉල්ලා සිටීම හෝ ඒ සඳහා යෝජනා ඉදිරිපත් කිරීම සහ/හෝ නිර්දේශ ඉදිරිපත් කිරීම කරනු ලබයි.

තවද, ඉහත ඡේදයේ සඳහන් ආකාරයේ අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමකට අදාලව පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු විසින් පාර්ලිමේන්තුවේ මහජන පෙත්සම් කාරක සභාව වෙත යොමු කරනු ලබන පැමිණිලි, අප ආයතනයේ කාර්යභාරය තුලට ඇතුලත් වන්නේ නම්, ඒවාද විමර්ශනය කර ඒ අනුව උචිත තීරණ වලට එළඹීම ද අපගේ ක්‍රියාකාරකම් වලට ඇතුලත් වේ.

මේ අනුව අප ආයතනයේ ප්‍රධාන කාර්යය වනුයේ රටේ පවත්නා නීතියට හා ඒ යටතේ සාදා ඇති රෙගුලාසි හා රීතින් වලට අනුකූලව කටයුතු කරමින්, ශ්‍රී ලංකා රාජ්‍ය තුල පවතින පරිපාලන යන්ත්‍රය නිවැරදි මගකට යොමු කරමින් කටයුතු කරන අතරම, මහජනතාවගේ කඩවී ඇතැයි කියනු ලබන අයිතිවාසිකම් වලට අදාල තීරණ නිවැරදි කරමින් ජනතාවට සහන සැලසීමයි.

**සේවා ලාභීන්**

මින් පෙර සඳහන් කරන ලද නිලධාරීන්ගේ තීරණ හේතුවෙන් අසාධාරණයට ලක් වූ මහජනතාව, සේවාලාභීන් වේ. අවසාන වශයෙන්, අපගේ ප්‍රයත්නය වනුයේ රටේ සමස්ථ පරිපාලන ක්‍රමයේ ප්‍රමිතිය ඉහල නැංවීමයි.

# 2022 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම සඳහා මූල්‍ය සම්පත්

| වර්ගය | රු: ශත |
|---|---|
| පුනරාවර්තන වියදම් | 720,000.00 |
| ප්‍රාග්ධන වියදම් | 100,000.00 |
| එකතුව | 820,000.00 |

## 2022 වර්ෂයේ ප්‍රසම්පාදන කටයුතු භාණ්ඩ, සේවා හා වැඩ ලෙස වර්ගීකරණය

(1) භාණ්ඩ

| | විස්තරය | ප්‍රසම්පාදන ක්‍රමය | අපේක්ෂිත කාල සීමාව | අපේක්ෂිත මිල රු: |
|---|---|---|---|---|
| | (අ) තාක්ෂණික උපකරණ | | | |
| (i) | Laser වර්ගයේ මුද්‍රණ යන්ත්‍ර 03ක් මිල දී ගැනීම | වෙළඳපොල මිල සැඳහුම් ක්‍රමය | 2022 මාර්තු-ජූලි | 100,000.00 |
| (i) | (ආ) ලිපි ද්‍රව්‍ය | රාජ්‍ය ආයතන හරහා (STC ආයතනය) | 2022 ජන.-දෙසැ. | 600,000.00 |

| | | | | |
|---|---|---|---|---|
| | (ඊ) <u>සේවා</u> | | | |
| (i) | ඡායාපිටපත් යන්ත්‍ර සේවා ගිවිසුම් | නියෝජිත ආයතන මඟින් | 2022 ජන.-දෙසැ. | 30,000.00 |
| (ii) | ෆැක්ස් යන්ත්‍ර සේවා ගිවිසුම් | නියෝජිත ආයතන මඟින් | 2022 ජන.-දෙසැ. | 10,000.00 |
| (iii) | ඇඟිලි සළකුණු යන්ත්‍ර සේවා ගිවිසුම් | නියෝජිත ආයතන මඟින් | 2022 ජන.-දෙසැ. | 15,000.00 |

(2) <u>වැඩ</u>

| | විස්තරය | ප්‍රසම්පාදන ක්‍රමය | අපේක්ෂිත කාල සීමාව | |
|---|---|---|---|---|
| (i) | කාර්යාලයේ පරිසනක ජාලගත කිරීම. | ප්‍රසම්පාදන කමිටු පත් කිරීම තුලින් මිල ගණන් කැඳවීම (තරඟකාරී ලංසු කැඳවීම) | 2022ජන.- දෙසැ. | ඇස්තමේන්තු කර නැත. |

දැනට අප කාර්යාලය බද්දු ක්‍රමයට පෞද්ගලික ගොඩනැගිල්ලක පවත්වාගෙන යනු ලබන අතර, ඉදිරියේදී ස්වාධීන ආයතන වන අප ආයතනය හා අනෙකුත් කොමිෂන් සභාව ද පිහිටුවිය හැකි ගොඩනැඟිල්ලක් බත්තරමුල්ල ප්‍රදේශයේ ස්ථාපිත කිරිමට යෝජිතය. ඒ අනුව ඉදිරි ක්‍රියාමාර්ග එහි පිහිටුවිමත් සමඟ සිදුකිරිමට අපේක්ෂා කරමි.

(කේ.ටී. චිත්‍රසිරි)

පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්

(ඔම්බුඩ්ස්මන්)